## කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය

# ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

## තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු පූර්ණ සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) - Deputy General Manager (Adminstration & Human Resources)

**(ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය, HM-1-3)**

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු 01**

**බාහිර අයදුම්කරුවන්**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

**පළපුරුද්ද** - රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් ලබා තිබීම.

(ආ) අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ

**පළපුරුද්ද** - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

(1) පහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම සපුරා තිබීම.

(2) ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM-1-1) සේවා ගණයෙහි අවම වශයෙන් වසර 02 අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(3) කළමනාකාර (MM-1-1) සේවා ගණයේ තනතුරක 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 07 අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

HM-1-3 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව.

**වැටුප් කේත අංකය :** HM-1-3 රු. 86,865/- = 2,270 x 15 = 120,915/-

**වයස් සීමාව** - අවුරුදු 35 නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

පොදුවේ ගෙවනු ලබන දීමනාවන්ට අමතරව HM-1-3 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් දීමනාද හිමිවේ.

**දීමනා**

1. මාසිකව ප්‍රවාහන දීමනාව වශයෙන් රු. 50,000/- ගෙවීම හා ඉන්ධන ලීටර 120 සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම.
2. සන්නිවේදන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම.

### 02. වෛද්‍ය නිලධාරී - Medical Officer

**(කළමනාකාර සේවා ගණය, MM-1-1)**

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු 01**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබිය යුතුය.**

01. එම්.බී.බී.එස්. උපාධිය සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම

හෝ

02. ආර්.එම්.පී. හෝ සමාන සුදුසුකම් සමග වෛද්‍ය වරයෙකු ලෙස පිළිගත් ආයතනයක පශ්චාත් යෝග්‍යතා වසරක (01) ක පළපුරුද්ද

සමග

වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස සේවය කිරීමට හැකිවන ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

MM-1-1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

**වැටුප් කේත අංකය** - MM-1-1, රු. 53,175/- = 1,375 x 10, 1,910 x 15 = 95,575/-

**වයස් සීමාව** - අවුරුදු 22 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 03. හෙදි නිලධාරී - Staff Nurse

**(කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය, MA-2-1)**

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු 01**

**අධ්‍යාපන සහ වෘත්තිය සුදුසුකම්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල / දෙමළ

II. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව එක් වරකදී විෂයන් හයකින් (06) සමත්වී තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) (විද්‍යා විෂය ධාරාවෙන්) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව ජාතික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

සහ

**නිපුණතා / ප්‍රවීණතා**

රජය විසින් පිළිගත් ආයතනයකින් හෙදි පුහුණුවට අදාළව ලබා ගත් සහතිකයක් සමග හෙදියක් ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබීම සහ පුහුණුවෙන් පසුව රජය විසින් පිළිගත් ආරෝග්‍යශාලාවක ලැබූ අවුරුදු එක (01) ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස් සීමාව** - අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 04. ඉංජිනේරු සහකාර - Engineering Assistaint (QS & IT)

**(කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය, MA-2-1)**

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු 02**

**බාහිර අයදුම්කරුවන්**

**තාක්ෂණික නිපුණතා හා ප්‍රවීණතා**

ඉංජිනේරු සහකාර තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි විදුලි / සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) මට්ටමට අඩු නොවන්නාවූ පාඨමාලාවක් සාර්ථකව හදාරා තාක්ෂණික නිපුණතා / ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

ඉංජිනේරු සහකාර ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ සුදුසුකම් ලබා තිබීමද ඉංජිනේරු සහකාර තොරතුරු තාක්ෂණය පිළිබඳ සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකා බලනු ලැබේ)

MA-2-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

**වැටුප් කේත අංකය ;** MA-2-1, රු. 30,310/- = 300 x 10,350 x 7,495 x 4,660 x 20 = 50,940/-

**වයස් සීමාව** - අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

ගෙවනු ලබන වැටුපට අමතරව පහත සඳහන් දීමනා හා ප්‍රතිලාභ ඉහත තනතුරු සියල්ල සඳහාම හිමිවේ.

**දීමනා**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු. 7,800/- ක් වන ජීවන වියදම් දීමනාව
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරි දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මසකට රු. 4,000/- වන දුෂ්කර දීමනාව (මුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණි)

**ප්‍රතිලාභ**

01. වාර්ෂික නිෂ්පාදන දිරිගැන්වීමේ දීමනාව
02. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
03. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    i. වසරක් සඳහා රු. 200,000/- ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    ii. වසරක් සඳහා රු. 20,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    iii. වසරක් සඳහා රු. 5,000/- දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
04. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබා දීම
    i. වසර දෙකකට වරක් රු. 12,000/- ක දීමනාව (විශේෂඥ වෛද්‍ය ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, ඇස් කණ්ණාඩි හා ශ්‍රවණාධාර වියදම්)
05. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.
06. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක්ද සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

01. සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විම.
02. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
03. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
04. තෝරාගනු ලබන අයදුම්කරුගේ මුළු ඉපයීම් වලින් උපයන විට ගෙවීමේ බද්ද (Pay as You Eam Paye Tax) අය කර ගනු ලැබේ.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත්‍ර තම අදාළ දෙපාර්තමේන්තුවල / ආයතන වල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා වන අයදුම් පත් (අදාළ සහතික පත්‍ර වල ඡායාස්ථ පිටපත්ද සමග) ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/21 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2020 ජූලි මස 06 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුවේ.

**සභාපති,**
**ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,**
**අංක 341/21, සරණ මාවත, රාජගිරිය.**

Source: Sunday Observer, Silumina (2020.06.21)